**ජාතික යොවුන් සේනාංකය - 2016**
**-------------------------------------**

ජාතික යොවුන් සේනාංකයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2002 අංක 21 දරන ජාතික යොවුන් සේනාංක පනතේ 17 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සේනාංකයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සේනාංකයේ අධ්‍යක්ෂ වෙත 2018 සැප්තැම්බර් 06 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සේනාංකයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සේනාංකයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

------

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික යොවුන් සේනාංකයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

--------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01**

---------------------------------------------------

ප්‍රමිතයේ 118 ඡේදය ප්‍රකාරව පිළියෙල කළ යුතු ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනයෙහි සමුච්චිත ලාභ/(අලාභ) හෙළිදරව් කිරීම පරිවර්තන සංචිතය ලෙස දක්වා තිබුණි.

(ආ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

---------------------------------------------------

ප්‍රමිතයේ 69 ඡේදය ප්‍රකාරව වත්කම් ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීම සඳහා සුදුසු තත්ත්වයට ගෙන ආ පසුව වුවද සේනාංකය විසින් ඊට පටහැනි ලෙස වත්කම් මිලදී ගත් වර්ෂයේදී ක්ෂය කිරීම සඳහා ප්‍රතිපත්තියක් සකස් කරගෙන තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී ඉදිකරන ලද රු.761,743 ක් වටිනා නල ළිඳක් පාවිච්චියට ගත හැකි ලෙස සකස් කර තිබුණේ 2017 ජූනි 06 දින දී වුවත් එය ඉඩම් සහ ගොඩනැගිලි යටතේ සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කර වාර්ෂික ක්ෂය ලෙස රු.38,087 ක්ද ගිණුම්ගත කර තිබුණි.

#### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ ධාරිතා සංවර්ධනය සඳහා වියදම රු.8,898,052 ක් ලෙස ගිණුම්ගත කර තිබුණු නමුත් පුහුණු අංශයෙන් ලද තොරතුරු අනුව එම වියදම් රු.8,578,220 ක් වුයෙන් රු.319,832 ක වෙනසක් නිරීක්ෂණය විය.

#### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විෂයය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොකළ සාක්ෂි |
| --- | --- | --- |
| (අ) උපචිත වියදම් - වෘත්තීය පුහුණු (වර්ෂය තුළ ශේෂය අඩු වීම) | 336,600 | නිරවුල් කළ බවට සනාථ කිරීම් |

(ආ) වෘත්තිය පුහුණු වියදම් | 13,452,896 | පුහුණුලාභියා පිළිබඳව ඌන පුහුණුව සඳහා යොමු කළ ආයතනය පිළිබඳ තොරතුරු

**2.3 ලැබිය යුතු මුදල්**

--------------------

යොවුන් සේනාංකයට පරිබාහිර ආයතනයක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී දරන ලද විදුලිය හා ජල වියදම් වෙනුවෙන් අයකරගත යුතු වූ රු.2,182,203 ක් හා 2015 වර්ෂය සඳහා වූ රු.2,180,075 ක් වශයෙන් එකතුව රු.4,362,278 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

--------------------------------------------------------------------------------

2002 අංක 21 දරන යොවුන් සේනාංක පනතේ 2(4) වගන්තිය ප්‍රකාරව යොවුන් සේනාංක සභාවේ කටයුතු පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෘත්තිය පුහුණුව, යොවුන් සංවර්ධනය සහ ස්ථාපනය යන කාර්යයන් සඳහා කමිටු තුනක් පත් කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

------------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සේනාංකයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.45,241,241 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.11,053,605 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.56,294,846 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරාවර්තන ප්‍රදාන ඇතුළු මුළු ආදායම වැඩිවීම බෙහෙවින් බලපා තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

--------------------------------------

සමාලෝචිත වර්ෂයේදී සේනාංකයේ ආදායම රු.806,652,133 ක් වූ අතර එයින් රු.291,479,858 ක් හෙවත් සියයට 36 ක් වර්ෂයේ වැටුප්, වේතන හා සේවක පාරිශ්‍රමික වෙනුවෙන්ද, රු.224,657,531 ක් හෙවත් සියයට 27 ක් සිසුන් සඳහා දිමනා, පුහුණු හා තරුණ සංවර්ධන වැඩසටහන් වෙනුවෙන්ද වැය කර තිබුණි.

අයවැය යෝජනා යටතේ සේනාංකය සඳහා නව මධ්‍යස්ථාන ඉදිකිරීමේ නියමු ව්‍යාපෘතිය සඳහා රු.548,467,200 ක් සමාලෝචිත වර්ෂයේදී මහා භාණ්ඩාගාරයෙන් ලබී තිබුණු අතර නව මධ්‍යස්ථාන 13 ක් ආරම්භ කර තිබුණි. පුනරාවර්තන වියදම් වෙනුවෙන් රු.170,878,675 ක් ද ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් රු. 377,588,525 ක් ද වියදම් කර තිබුණි. නමුත් මෙම වියදම්වලින් බොහොමයක් දැනට පැවති මධ්‍යස්ථාන වල පුහුණුලාභීන්ට ආහාර සැපයීම. නිල ඇඳුම් සැපයීම සහ පුහුණු මධ්‍යස්ථානයන්හි අලුත්වැඩියාවන් වැනි කටයුතු වෙනුවෙන් දරන ලද බව නිරීක්ෂණය විය.

**3.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

--------------------------------------

සේනාංකයේ ඉකුත් වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේ ජංගම සහ ක්ෂණික අනුපාත පහත දැක්වේ.

| ද්‍රවශීලතා අනුපාත | 2016 | 2015 |
|---|---|---|
| ජංගම අනුපාතය | 1.57:1 | 6.11:1 |
| ක්ෂණික අනුපාතය | 1.04:1 | 0.79 :1 |

ජංගම අනුපාතය අඩුවිම කෙරෙහි ජංගම වගකීම්වල වැඩිවීමද, ක්ෂණික අනුපාතය වැඩිවීමට මුදල් හා අනෙකුත් ලැබීම්වල වැඩිවීමද බලපා තිබුණු බව නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

### 4.1. කාර්යසාධනය
-------------------

2002 අංක 21 දරන ජාතික යොවුන් සේනාංක පනතේ 3 වගන්තිය අනුව සේනාංකයේ අරමුණ වන්නේ යොවුන් සංවර්ධනය, රැකියා පුහුණුව සහ වෘත්තීය සංවර්ධනයයි. එම අරමුණ ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ පළමු සහ දෙවන කණ්ඩායම් සඳහා බඳවා ගන්නා ලද පුහුණුලාභීන් 11,978 දෙනෙකු අතරින් 4,515 දෙනෙකු පාඨමාලාව හැරගොස් තිබුණු අතර 7,463 දෙනෙකු පාඨමාලාව සාර්ථකව නිමකර තිබුණි. නමුත් පාඨමාලාව සාර්ථකව නිමකළ පුහුණුලාභීන්ගෙන් ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය සඳහා වූ නිපුණතා පරීක්ෂණයට ඉදිරිපත් වී තිබුණේ 5,762 දෙනෙකු පමණි. එයින් පුහුණුලාභීන් 5,342 දෙනෙකු ඇගයීම් සමත් වී තිබුණද, සහතික පත් නිකුත් කර තිබුණේ පුහුණුලාභීන් 4,397 දෙනෙකුට පමණක් වන අතර පුහුණුලාභීන් 945 දෙනෙකු සතුව ජාතික හැඳුනුම්පත් නොතිබීම වැනි හේතූන් නිසා සහතික පත් ලබාදී නොතිබුණි. පාඨමාලාව සාර්ථකව නිම කිරීම පිළිබඳව පරීක්ෂාවේදී, මධ්‍යස්ථාන ප්‍රමාණය 35 සිට 48 දක්වා වැඩිවුවද, පාඨමාලාවේ සාර්ථකත්වය සියයට 68 සිට සියයට 62 දක්වා අඩුවී තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) 2016 වර්ෂයේ අයවැය යෝජනා අනුව නව මධ්‍යස්ථාන 13 ක් සේනාංකය විසින් ආරම්භ කර තිබුණි. මෙම මධ්‍යස්ථානවල 2016 වර්ෂයේ දෙවන කණ්ඩායමට අදාළව බඳවා ගත් සිසුන් සංඛ්‍යාව 1,264 දෙනෙකු වූ අතර ඉන් 645 දෙනෙකු එනම් සියයට 51 ක් පාඨමාලාව හැරගොස් තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී සේනාංකය විසින් රු.13,452,896 ක් වැය කර සිසුන් 3,523 දෙනෙකු වෘත්තීය පුහුණුව සඳහා යොමුකර තිබුණත් සිසුන් 1,060 දෙනෙකු පුහුණුව හැරගොස් තිබුණි.

(ඈ) දඹුල්ල හෝටල් පාසල මගින් පුහුණුව ලබා දිය හැකි අර්ධ වර්ෂයක සාමාන්‍ය සිසුන් ධාරිතාව 250 ක් පමණ වේ. 2016 වර්ෂයේදී රු.4,003,270 ක වියදමින් පාඨමාලාව අවසන් කර තිබූ සිසුන් සංඛ්‍යාව පළමු අර්ධ වර්ෂය තුළ 57 ක් හා දෙවන අර්ධ වර්ෂය තුළ 233 ක් විය. ඒ අනුව හෝටල් පාසලේ සම්පත් උපයෝජනය සතුටුදායක මට්ටමක නොවූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේදි පාඨමාලාව නිම කළ සිසුන් සංඛ්‍යාව 7,463 ක් වූ අතර ඉකුත් වර්ෂයේදි පාඨමාලාව නිම කළ සිසුන් සංඛ්‍යාව 5,226 ක් විය. නමුත් එයට සාපේක්ෂව විසිර යාමේ වියදම් පිළිවෙලින් රු.6,423,121 ක් සහ රු.13,832,168 ක් වූ අතර 2016 වර්ෂයේදී දරන ලද සියළුම වියදම් විසිර යාමේ වියදම් ගිණුමට හර නොවීම මේ සඳහා හේතු වී තිබුණි.

**4.2 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ අරමුණුවලට අනුකූල නොවන කාර්යයක් වන 68 වන ජාතික නිදහස් දින පෙලපාලිය සඳහා සහභාගී වීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී සේනාංකය විසින් රු.263,176 ක් වැයකර තිබුණි.

(ආ) 2016 වර්ෂයේ දී හෝටල් පාඨමාලා ගාස්තු වශයෙන් පුහුණුලාභීන්ගෙන් රු.440,900 ක් අයකර තිබුණි. නමුත් මෙලෙස පාඨමාලා සඳහා ගාස්තු අය කිරීම සඳහා සභාවෙන් අනුමැතියක් ලබා ගත් බවට සහ පාඨමාලා ගාස්තු තීරණය කිරීමට අදාළව ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) 2016 වර්ෂයේ දී බාහිර ආයතන සඳහා බැහැරගත පුහුණු වැඩසටහන් 13 ක් පවත්වා රු.1,908,075 ක ආදායමක් ලබා තිබූ අතර ඒ සඳහා රු.1,166,328 ක වියදමක් දරා තිබුණි. බාහිර ආයතන සඳහා වැඩසටහන් පැවැත්වීමට යොවුන් සේනාංක සභාවෙන් අනුමැතියක් ලබාගෙන නොතිබූ අතර වැඩසටහන් සඳහා ගාස්තු අයකිරීම හා වියදම් කිරීම සඳහා කුමන පදනමක් අදාළ කරගත්තේද යන්න පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොකෙරුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දී පුහුණු මධ්‍යස්ථාන 15 ක පුහුණුලාභීන් හා කාර්ය මණ්ඩලය සඳහා සංවිධානය කර තිබූ අධ්‍යාපන චාරිකාව සඳහා පුහුණුලාභීන් 665 දෙනෙකු ද කාර්ය මණ්ඩලය හා අනෙකුත් නිලධාරීන් 115 දෙනෙකු ද වශයෙන් අපේක්ෂිත සහභාගිත්වය 780 දෙනෙකු විය. නමුත් සත්‍ය වශයෙන් පුහුණුලාභීන් 558 දෙනෙකුද කාර්ය මණ්ඩලය හා අනෙතුක් නිලධාරීන් 163 දෙනෙකු ද වශයෙන් 721 දෙනෙකු සහභාගී වී තිබූ අතර මේ වෙනුවෙන් දරා තිබූ මුළු වියදම රු.3,328,514 ක් විය.. මේ අනුව පුහුණුලාභීන්ගේ සහභාගීත්වය වැඩිවීම වෙනුවට කාර්ය මණ්ඩලයේ හා අනෙකුත් නිලධාරීන්ගේ සහභාගීත්වය වැඩිවී තිබූ අතර අධ්‍යාපන චාරිකාව සඳහා පුහුණුලාභීන් සහභාගි කරවීමේ අරමුණ ඉටු වී නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඉ) දඹුල්ල, ගාල්ල සහ දික්වැල්ල යොවුන් සේනාංක මධ්‍යස්ථානවල චීන භාෂා විද්‍යාගාර 03 ක් ස්ථාපිත කිරීම සඳහා රු. මිලියන 13 ක් සමාලෝචිත වර්ෂයේදී චීන රජය විසින් ලබා දී තිබුණි. නමුත් දඹුල්ල විද්‍යාගාරය පමණක් ස්ථාපනය කර තිබුණි.

**4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගන්නා ලද රු.4,580,520 ක් වටිනා කාර්යාල පුටු 588 ක් දිවුලපිටියේ පිහිටා ඇති ගබඩාවකද රු.24,682,320 ක් වටිනා දේශන ශාලා පුටු 4,150 ක් පඩුවස්නුවර පිහිටි ගබඩාවකද 2018 අගෝස්තු 31 දින වන විටත් නිශ්කාර්යව රඳවා තබා ඇති බව නිරීක්ෂණය විය. මධ්‍යස්ථාන ඉදිකිරීම් නිමකිරීම ප්‍රමාද වීම හේතුවෙන් මෙම තත්ත්වය ඇතිවූ බව අධ්‍යක්ෂකවරයා විසින් දන්වා තිබුණි.

(ආ) නුවරඑළිය මධ්‍යස්ථාන භූමියේ පිහිටි මධ්‍යස්ථානාධිපති නේවාසිකාගාරය නිවාඩු නිකේතනයක් ලෙස සංවර්ධනය කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.3,239,971 ක් වැය කර තිබුණි. මෙම නිවාඩු නිකේතනය පරිහරණය කිරීම සඳහා ආයතනය විසින් විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණ අතර 2018 අගෝස්තු 31 දිනය වන විටත් මෙම ගොඩනැගිල්ල ඌන උපයෝජීතව පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගන්නා ලද රු.2.151,580 ක් වටිනා අයිතමයන් 7 කට අදාළව භාණ්ඩ ඒකක 43 ක් 2018 සැප්තැම්බර් 20 දින වන විටත් යක්කල ප්‍රධාන ගබඩාවේ නිශ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය.

**4.4 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම් / දේපලවල ව්‍යාපෘති ආරම්භ කිරීම**

සේනාංකය විසින් භාවිතා කරනු ලබන ගොඩනැගිලි පිහිටි ඉඩම්වල හිමිකාරිත්වය සේනාංකයට නොමැති බැවින් විගණනයට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනයන්හි ඉඩම් වටිනාකම් දක්වා නොමැති බව නිරීක්ෂණය විය. නමුත් එලෙස ඉඩම්වල නෛතික අයිතියක් නොතිබියදී සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි සඳහා එකතුකිරීම් ලෙස රු.66,469,092 ක් වැය කර තිබුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

2016 දෙසැම්බර් 31 දිනට සේනාංකයේ අනුමත කාර්ය මණ්ඩලය 880 ක් වූ අතර එය 509 ක ස්ථිර කාර්ය මණ්ඩලයකින්, 311 ක කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලයකින් සහ පැය පදනම මත සේවය කරන 60 දෙනෙකුගෙන් සමන්විත විය. ආයතනයේ අනුමත ස්ථිර කාර්ය මණ්ඩලයෙන් 93 ක් පුරප්පාඩු වුවත් කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලයේ 46 දෙනෙකු මෙම පුරප්පාඩු සඳහා බඳවාගෙන තිබූ අතර එම තනතුරු ඉංග්‍රීසි, දෙමළ හා තොරතුරු තාක්ෂණ උපදේශකයින් බව නිරීක්ෂණය විය. කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 66 ක් සහ පැය පදනමේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 4 ක් පවතුණි.

**4.6 වාහන උපයෝජනය**

සේනාංකය විසින් භාවිතා කරමින් තිබූ නමුත් වෙනත් ආයතනවලට අයත්, වටිනාකම රු.35,401,000 ක් වූ වාහන 10 ක් ආයතනයේ මෝටර් රථ ලෙස ගිණුම්ගත කර තිබුණු අතර එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඇතුළත් මෝටර් රථ වටිනාකමින් සියයට 91 ක් විය.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත් 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත්කර තිබුණේ 2018 පෙබරවාරි 20 දින එනම් වර්ෂයක පමණ ප්‍රමාදයකින් පසුවය.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 11 ක ඇස්තමේන්තුගත හා තත්‍ය සංඛ්‍යා අතර සියයට 72 සිට සියයට 100 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**5.3. ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

**5.3.1 ප්‍රසම්පාදනයන්**

(අ) ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ඡේදය ප්‍රකාරව සේනාංකය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදනය මාර්ගෝපදේශවලින් බැහැරවීම්
---------------------------------------------------

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.2(ඇ) ප්‍රකාරව පිරිවිතර ඇතුළු ලංසු ලේඛන කෙටුම්පත් සකස් කිරීම හා ඒවා සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද, තාක්ෂණික ඇගයීම් කමිටු පත් කර තිබුණේ ලංසු කැඳවීමේ කාල සීමාව ඉකුත් වීමෙන් පසුවය.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 ප්‍රකාරව වැට් බදු ගෙවීම් පිළිබඳ විස්තර විගණකාධිපතිවරයාටද පිටපතක් සහිතව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දී නොතිබුණි.

(ඇ) ප්‍රසම්පාදනය ක්‍රියාදාමයේ අඩුපාඩු
--------------------------------------

(i) 2016 වර්ෂයේ දී පෞද්ගලික සමාගමකින් රු.7,176,000 ක් වටිනා ත්‍රිරෝද රථ 12 ක් මිළදී ගෙන තිබුණු අතර 2016 මාර්තු 17 දිනැති ජාතික අයවැය චක්‍රලේඛයේ 5.2 ඡේදය ප්‍රකාරව මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා ගැනීමට පෙර ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබුණු අතර මිළදී ගනු ලැබූ ත්‍රීරෝද රථ පිළිබඳ විස්තර ස්ථාවර වත්කම් ලේඛනයක සටහන් කර නොතිබුණි. එසේම, පුහුණු මධ්‍යස්ථාන සඳහා ත්‍රීරෝද රථ මිළදී ගත්තද, අනුමත කාර්ය මණ්ඩලයට රියදුරන් ඇතුළත්ව නොතිබුණු බැවින් මධ්‍යස්ථානවල සේවය කරනු ලබන රියදුරන් නොවන නිලධාරීන් විසින් මෙම ත්‍රීරෝද රථ ධාවනය කර තිබුණි.

(ii) පුහුණුලාභීන්ගේ නිල ඇඳුම් ප්‍රසම්පාදනය සඳහා ලබා ගත් තත්ත්ව සහතිකයේ අදාළ තාක්ෂණික නිලධාරීන්ගේ අත්සන් නොමැති වීම මත අවම මිල ඉදිරිපත් කළ ආයතනය ප්‍රතික්ෂේප කර දෙවන අවම ලංසුව වූ රු.64,950.053 ඉදිරිපත් කළ ආයතනයට ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි.

(iii) විසිර යාමේ නිල ඇඳුම් කට්ටලයට අයත් වන කලිසම් 5,000 ක්, කමිස 3,196 ක්, සුදු මේස් බැනියම් 10,000 ක්, බඳපටි 500 ක්, බෙරට්ස් හිස් වැසුම් 620 ක් සහ බූට් සපත්තු යුගල් 1,299 ක් යන අයිතමයන් මිළදී ගැනීම වෙනුවෙන් රු.13,666,162 ක් සමාලෝචිත වර්ෂය තුළදී වැයකර තිබුණි.

(iii-i) විසිර යාමේ නිල ඇඳුමේ කමිසය සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1 ප්‍රකාරව පිරිවිතර පිළියෙල කර නොතිබියදීත් " පිරිවිතරය" පදනම් කරගෙන අවම මිල තෝරා නොගැනීම හේතුවෙන් රු.1,000,000 ක අධි වියදමක් දැරීමට සිදුවී තිබුණි.

(iii-ii) නිල ඇඳුම් කට්ටලයේ කමිසය සහ කලිසමේ සාම්පල් සඳහා සුදුසුකම්ලාභී ආයතනයක් වෙත ඉදිරිපත් කර තත්ත්ව වාර්තාවක් ලබා පෙර ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි.

(iii-iii) කලිසම් සහ බැනියම් සැපයීමේ ප්‍රසම්පාදනය පිරිනමා තිබූ පෞද්ගලික ආයතනය විසින් 2016 දෙසැම්බර් 02 දින කලිසම් 500 ක් සහ බැනියම් 500 ක් යක්කල ප්‍රධාන ගබඩාව වෙත සපයා තිබුණු නමුත් ශිවිසුම් අත්සන් කර තිබුණේ 2016 දෙසැම්බර් 05 වන දිනදීය.

## 5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2015 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව 2018 අගෝස්තු 31 දින වන විටද පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 6. කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේදී ගිවිසුම්ගත වටිනාකම රු.1,616,321,467 ක් වූ ඉදිකිරීම් 56 ක කොන්ත්‍රාත් පිරිනමා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වශයෙන් රු.218,231,200 ක් ගෙවා තිබූ අතර 2016 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය අනුව ඉදිකිරීම් 02 ක් පමණක් සියයට 45 ක් නිමකර තිබූ අතර අනෙකුත් සියළුම ඉදිකිරීම්වල ප්‍රගතිය සියයට 5 ත් සියයට 25 ත් අතර පැවතුණි.

## 7. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සේනාංකයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ගිණුම්කරණ කටයුතු සිදුකිරීමට අවශ්‍ය පරිදි ගිණුම්කරණ පද්ධතියක් නඩත්තු කර නොමැති වීම |
| (ආ) | ඉන්වෙන්ට්‍රි පාලනය | ලේඛන පවත්වා ගැනීමේ දුර්වලතා |
| (ඇ) | අයවැය පාලනය | වැය විෂයයන් සඳහා ඇස්තමේන්තු කරන ලද වියදම් හා තත්‍ය වියදම් අතර විචලනයන් පැවතීම |
| (ඈ) | තොරතුරු පද්ධති පවත්වාගැනීම | හඳුන්වා දී ඇති තොරතුරු පද්ධතියේ යාවත්කාලීන කරන ලද නිවැරදි තොරතුරු පහසුවෙන් හා ඉක්මණින් ලබාගත නොහැකි වීම |
| (ඉ) | ප්‍රසම්පාදනය | අවිධිමත් ප්‍රසම්පාදන ලිපිගොනු නඩත්තුව හා ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අඩුපාඩු |